**කින්නියා නගර සභාව - 2023**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කින්නියා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන **පළාත් පාලන ආයතන සඳහා වූ** පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | පළාත් සහා ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 3,846,400 මූල්‍ය ප්‍රකාශනවල රු. 32,173,680 ක් ලෙස දක්වා තිබුණි. | පිළිගනු ලැබේ. ඉදිරියේ දී නිවැරදි කිරීම කරනු ලැබේ | නිවැරදි මුදල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රු. 7,742,969ක් වටිනා සභා කාර්යාලය සහ මහජන පුස්තකාල ගොඩනැගිලිවල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් ගොඩනැගිලි ගිණුම යටතේ ඉදිරියට ගෙනවිත් නොතිබුණි. | පිළිගනු ලැබේ. දැනට මෙවැනි වැරදි නිවැරදි කරනු ලැබේ. | ගිණුමේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ කරන ලද ප්‍රතිසංස්කරණ වැඩ සඳහා ගෙවිය යුතු රු. 3,629,064 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පිළිගනු ලැබේ. ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල මූල්‍ය ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | ලද බදු රු. 3,181,924ක්, හිඟ මුදලින් අඩුකර දක්වා නොතිබුණි. | පිළිගනු ලැබේ. දැනට මෙවැනි වැරදි නිවැරදි කරනු ලැබේ. | නිවැරදි මුදල මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 සහ 2023 වර්ෂවල වර්ග 08 ක ලී බඩු හා සවිකිරීම් සහ පොත්පත්වල වටිනාකම රු. 627,214 ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරිමට පියවර ගෙන ඇත. | අදාළ ගිණුමේ ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී දේපළ බදු අය කිරීමේදී සභාවෙන් අතිරේකව අයකළ රු. 70,291ක දේපළ බදු මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරියේදී ගැලපීම් සිදුකර වැරදි නිවැරදි කරනු ලැබේ. | අදාළ මුදල මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 153,662,447 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඔබ විසින් පෙන්වා දෙන ලිපි ලේඛන ඔබ වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | ලේඛනමය සාක්ෂි ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1),(2), (3) | වසර දෙකකට වැඩි කල් ඉකුත් වූ තැන්පතු 83ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කඩිනම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු. 6,620,366 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම් රු. 11,674,683 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,761,000 | 12,606,000 | 2,992,000 | 9,614,000 | 4,911,000 | 10,205,000 | 2,510,000 | 7,695,000 |
| (ii) | කුලී | 20,000,000 | 69,604,000 | 4,593,000 | 65,011,000 | 20,345,000 | 48,974,000 | 3,063,000 | 45,911,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,245,000 | 3,079,000 | 3,079,000 | -- | 1,675,000 | 1,675,000 | 1,675,000 | -- |
| (iv) | වෙනත් ආදායම් | 7,113,000 | 16,760,000 | 2,331,000 | 14,429,000 | 4,200,000 | 10,676,000 | 1,029,000 | 9,647,000 |
| (v) | එකතුව | 40,119,000 | 102,049,000 | 12,995,000 | 89,054,000 | 31,131,000 | 71,530,000 | 8,277,000 | 63,253,000 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියලුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ වරිපනම් ගිණුමේ ශේෂය රු. 9,614,000 ක් පැවතුණි. | පිළිතුරු සපයා නැත. | හිඟ මුදල් අයකිරීමට පියවර ගත යුතුයි. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු බදු කුලී එකතුව රු. 27,267,000 ක් අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනතට අනුව, නියමිත කාලය තුළ ගෙවීමට නොහැකිවීම නිසා දඩ මුදල් ලෙස රු. 32,497ක් එම | ඉදිරි කාලයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | සේවක භාර අරමුදල් පනත ප්‍රකාරව ගෙවීම් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුදලට අතිරේකව සභාව විසින් ගෙවා තිබුණි.. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී බදු වටිනාකමින් සියයට 40 වූ අඩුකිරීම් රු. 244,400ක්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ නිර්දේශ සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව සභාව විසින් අඩු කිරිම් කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවී වලක්වනු ලැබේ. | අදාළ චක්‍රලේඛනට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාර්ෂික වාහන බලපත්‍ර ප්‍රමාද වී ලබාගැනීම නිසා සභාවට රු. 48,520 ක පාඩුවක් සිදු විය. | ඉදිරියේදී වලක්වනු ලැබේ. | වාහන බලපත්‍ර කාලපමාවකින් තොරව ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා නිකුත් කරන ලද සංවර්ධන බලපත්‍ර 89 සඳහා අනුකූලතා සහතික සභාව විසින් නිකුත් කර නොතිබුණි. | ඉදිරිකාලයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුයි. |
| (ආ) | නගර සභා බල ප්‍රදේශය තුළ වූ මාර්ගවල වැලි ප්‍රවාහනය කිරීමේ වාහනවලට අදාළ ගාස්තු අයකිරිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරනු ලැබේ. | මාර්ග භාවිත වාහන සඳහා ගාස්තු අය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුයි. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **3.3.1** | **නිෂ්කාර්ය වත්කම්** | | |
| (අ) | පළාත් පාලන සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ශීතල කාමරය නිශ්චිත අරමුණට භාවිතා කර ආදායම් උපයා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | කඩිනමින් පියවර ගනු ලැබේ. | නිශ්චිත අරමුණු භාවිතා කරමින් ආදායම් ඉපැයීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිලදී ගත් කොම්පෝස්ට් කුඩු කිරීමේ යන්ත්‍රය කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදවීමට සහාව කටයුතු කර නොතිබුණි. | මේ වන විට අබලන් තත්ත්වයේ පවතින බැවින් අලෙවි කිරීමට පියවර ගනිමින් සිටී. | ආදායම් ඉපැයීමේ කටයුතු සිදු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක් පුරප්පාඩු ලෙස පවතින ලේකම් සහ ගණකාධිකාරී තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත් නොකර තිබුණි. | ඔබ විසින් පෙන්වා දී ඇති පත්වීම් පත්කිරීම් බලධාරියා විසින් පත්කරනු ලබන විට පුරප්පාඩු පුරවනු ලබන බව අපේක්ෂා කෙරේ. | අදාළ ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ ඇති රෙගුලාසිවලට අනුකූලව ආයතන 08ක් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | මේ වන විට පියවර ගෙන ඇත | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කඩිනම් කළ යුතුය. |